## නාවික හමුදා පනතේ 113 වන වගන්තිය

(1) තම සේවයේ යෙදී සිටින තැනැත්තෙකුට ස්වේච්ඡා නාවික බල හමුදාවේ හෝ ස්වේච්ඡා නාවික උපසේවයේ සාමාජිකයෙකු වීමට හෝ සාමාජිකයෙකුව සිටීමට ද ඒ බල හමුදාවේ හෝ උප සේවයේ සාමාජිකයෙකු වු එබඳු යම් තැනැත්තෙකුට මේ පනතේ බලය ප්‍රකාර ලැබීමට සහ ඉටු කිරීමට නියම කරනු ලබන නාවික පුහුණුව සහ සේවය ලැබීමට සහ ඉටු කිරීමට ද හැකිවනු පිණිස නිසි පහසුකම් සියල්ල සලසා දීම සෑම සේවා යෝජකයෙකුගේම යුතුකම විය යුතුය.

(2) (අ) (1) වෙනි උප වගන්තියේ සඳහන් පහසුකම් සළසා නොදෙන හෝ

(ආ) ඒ උප වගන්තියේ සඳහන් යම් පුහුණුවක් හෝ සේවයක් ලැබීම සහ ඉටු කිරීම නිසා සේවකයෙකු සේවයෙන් පහ කරන හෝ ඔහුගේ වැටුප් අඩු කිරීමෙන් හෝ වෙනයම් ක්‍රමයකින් දඩුවම් කරන යම් සේවා යෝජකයෙකු වරදකට වරදකරු විය යුතුය. ඔහු සුළු අපරාධ විනිශ්චය කරුවෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට වැඩි නොවු දඩයකින් හෝ මාස හයකට වැඩි නොවු කාලයක් වැඩ නැතිව හෝ බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමෙන් හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාර ගත කිරීම යන දෙකින්ම දඩුවම් ලැබිය යුතුය.